සැ. යු. : (i)   2025.09.04 දින පළ කරන ලද අංක 2453 ගැසට් පත්‍රයේ IV අ කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,454 - 2025 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා - 2025.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1816 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | —— |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1813 - B 82718— 5,403 (2025/09)
F 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඵ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**විගණන සේවා කොමිෂන් සභාව**

## ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ශ්‍රේණියේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති (වරලත් සිවිල් ඉංජිනේරු) තනතුර සඳහා ඍජු ධාරාව මත බඳවා ගැනීම - 2025

ජාතික විගණන කාර්යාලයේ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ශ්‍රේණියේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති (වරලත් සිවිල් ඉංජිනේරු) තනතුරට ඍජු ධාරාව මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **බඳවාගැනීමේ ක්‍රමය.**- මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණකර ඇති අයදුම්කරුවන් අතරින්, විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පරිශිෂ්ටය 03 හි සඳහන් පරිදි පහත නිර්ණායකයන්ට යටත්ව (අංක 5 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ :-

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 |
| තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද | 40 |
| තොරතුරු තාක්ෂණය/පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් | 05 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 10 |
| එකතුව | 100 |

*සටහන* :-

බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

පත්වීම ක්‍රියාත්මකවන දිනය විගණන සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2. **අවශ්‍ය සුදුසුකම්** :- සෑම අයදුම්කරුවකු ම අයදුම්පත් කැඳවන අවසාන දිනට පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

I. අධ්‍යාපන සුදුසුකම් :- අදාළ නොවේ.

II. වෘත්තීය සුදුසුකම් :-
වරලත් සිවිල් ඉංජිනේරුවරයකු වීම.
(මෙම තනතුරු සඳහා ඍජු ධාරාව මත බඳවා ගැනීමේ දී වරලත් සිවිල් ඉංජිනේරුවන් සඳහා එක් තනතුරක් පමණක් වෙන් කරනු ලැබේ.)

III. පළපුරුද්ද:-
අදාළ වෘත්තිය සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 12 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.
(මේ සම්බන්ධයෙන් සේවා කාලය ගණන් ගැනීමේ දී පූර්ණ වැටුප් සහිත, අඩ වැටුප් සහිත සහ වැටුප් රහිත අධ්‍යයන නිවාඩු සැලකිල්ලට ගනු නොලැබේ.)

IV. **ශාරීරික යෝග්‍යතාව:-**
ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

V. **වෙනත් සුදුසුකම් :-**
(i). ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම;
(ii). විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;
(iii). යම් ආගමික පැවිදිවරයක් දරන තැනැත්තකු නොවීම;
(iv). අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

VI. **වයස:-2025 ඔක්තෝබර් මස 12 වැනි** දිනට වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර එදිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. ඒ අනුව 1980.10.12 දින සිට 1990.10.12 දින දක්වා එම දින ද ඇතුළත්ව උපන් දිනය යෙදෙන අයට අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය.

(රාජ්‍ය සේවයේ නියුක්ත නිලධරයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා කොන්දේසි :-**

(i). මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii). මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධරයකු මෙම තනතුරට පත් කරනු ලැබුවහොත් වසරක පරිවාස කාලයකට යටත්වේ. එසේ වුව ද එම නිලධරයාගේ පූර්ව සේවා කාලය හා පළපුරුද්ද නව තනතුරට අයත් සුදුසුකමක් හා උපවාසයක් නොවන කල්හි අවුරුදු තුනක පරිවාස කාලයට යටත්වේ. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii). 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට ආනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර තුනක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(iv). රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v). ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

4. **වැටුප් පරිමාණය** :- 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු. 86,950- 10 x 2,400 - 8 x 2,940 - 17 x 3,900 - රු.200,770/- (පියවර 20) වේ.

ඒ අනුව මෙම තනතුරට හිමි වැටුප් කේතය AS 03 - 2025 වන අතර ආරම්භක වැටුප් පියවර රු.138,370/- වේ. (2027.01.01 දින තෙක් ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ උපලේඛන III අනුවය) මෙයට අමතරව තනතුරට අදාළවන පරිදි රජය විසින් අනුමතකර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු ලබා දීමේ පටිපාටිය පදනම් කර ගනු ලැබේ. :-

| *අනු අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | 25 |
| | (අ) **සාමාන්‍ය උපාධිය** | 10 | |
| | (ආ) **විශේෂ උපාධිය** | 11 | |
| | (ඇ) **2 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය** | 11 | |
| | (ඈ) **2 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය** | 13 | |
| | (ඉ) **1 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය** | 13 | |
| | (ඊ) **1 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය** | 15 | |
| | (උ) **පශ්චාත් උපාධි ඩිප්ලෝමාව** | 18 | |
| | (ඌ) **MA/MSC හෝ ඒ හා සමාන වෙනත් උපාධියක්** | 20 | |
| | (එ) **ඉහත (ඌ) හි සඳහන් උපාධියකට වඩා ඉහළ උපාධියක්** | 25 | |
| 02. | **අතිරේක වෘත්තිය සුදුසුකම් :** | | 20 |
| | **(මූලික වෘත්තීය සුදුසුකමට අමතරව ලබා ඇති ඉහළම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)** | | |
| | (අ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 07 | |
| | (ආ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික II /අන්තර්මාධ්‍ය පරීක්ෂණය /ගිණුම්කරණ හා ව්‍යාපාර සහතික පත්‍රය II / ව්‍යාපාර අදියර/ වරලත් කළමනාකාරිත්ව ගණකාධිකාරී ආයතනයේ II අදියර පරීක්ෂණය සමත් වීම | 09 | |
| | (ඇ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන I කොටසේ පරීක්ෂණය / වරලත් කළමනාකාරිත්ව ගණකාධිකාරී ආයතනයේ III අදියර පරීක්ෂණය සමත් වීම | 12 | |
| | (ඈ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරිත්ව ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය | 15 | |
| | (ඉ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය | 20 | |
| 03. | **තොරතුරු තාක්ෂණය / පරිගණක හැකියාව පිලිබඳ සුදුසුකම්** විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයකින් පිරිනමනු ලබන මාස 6ක හෝ ඊට වැඩි කාලයක පරිගණක සහතිකපත්‍ර පාඨමාලාවක් සමත්ව තිබීම හා සහතිකයක් ලබා තිබීම. | 05 | 05 |

ඉහත සටහනට අමතරව තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සඳහා වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 40 ක්ද, සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය සඳහා උපරිම ලකුණු 10 ක් ද වෙන්කර ඇත. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

6. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ. :-

(i). පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;

(ii). වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. **අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය** :

(i) අයදුම්පත් "ලේකම්, විගණන සේවා කොමිෂන් සභාව, අංක 35/ඒ, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, කොළඹ 08," යන ලිපිනයට **2025 ඔක්තෝබර් 12** දිනට හෝ එදිනට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට අංක 04 දක්වාත්, දෙවැනි පිටුව අංක 05 සිට අංක 08 දක්වාත්, තෙවැනි පිටුව අංක 09 සිට අංක 10 දක්වාත් වන ආකාරයට පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "සෘජු ධාරාව මත ජොෂ්ඨ සහකාර විගණකාධිපති (වරලත් සිවිල් ඉංජිනේරු) තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.71,240/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) අයදුම්පතක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් ප්‍රමාද කරන අයදුම්කරුවන් ඉන් සිදුවිය හැකි පාඩුව තමන් විසින් ම විඳ දරා ගත යුතුය.

(vi) විදේශගත ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ට තම අයදුම්පත් ලේකම්, විගණන සේවා කොමිෂන් සභාව වෙත එවනු සඳහා තමන් පදිංචි රටට නැතහොත් ආසන්නම රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට ස්වකීය අභිමතය පරිදි පිළිවන.

(vii) *වෛද්‍ය පරීක්ෂණ සඳහා යානා පත්‍ර* - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස පිටරටින් තෝරාගනු ලබන ශ්‍රී ලාංකික අයදුම්කරුවෙකු වේ නම්, ඔහු සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා වන ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ යානා පත්‍ර වියදමත් එම අයදුම්කරු විසින් ම දැරිය යුතුය.

(viii) රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / සංස්ථා සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් නියමිත දින හෝ එදිනට පෙර ලැබෙන සේ විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර, මෙම කාර්යාලයේ කිසිදු නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

(ix) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(x) අයදුම්පත්‍රය සමඟ පහත ලේඛනවල සහතික කරන ලද එක් ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතුය. :-

(අ) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත;

(ආ) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත;

(*සැ.යු.* :- බෞතීස්ම සහතික හෝ උපකෘත පාසල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.)

(ඇ) සාමාන්‍ය උපාධිය සහ එයට ඉහළ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පිටපත් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්) :

(ඈ) ප්‍රධාන වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ 2. II පරිදි) සහ අතිරේක වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්) සනාථ කෙරෙන සහතික පිටපත්;

(ඉ) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික;

(ඊ) තොරතුරු තාක්ෂණය හා පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්);

(උ) චරිතය පිළිබඳව සඳහන්වන මෑතක දී ලබාගත් සහතික දෙකක්.

(දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / සංස්ථා සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට අදාළ නොවේ.)
**සටහන .-** සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතික කරන ලද පිටපත් සනාථ කර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

8. **සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හා නොපිරවීමේ අයිතිය විගණන සේවා කොමිෂන් සභාව සතු වේ.

10. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

විගණන සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී. කේ. විජේසිංහ,
ලේකම්
විගණන සේවා කොමිෂන් සභාව.

2025 සැප්තැම්බර් මස 04 දින
අංක 35/ඒ, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08,
විගණන සේවා කොමිෂන් සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ජාතික විගණන කාර්යාලය**

**ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ගණයේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති (වරලත් සිවිල් ඉංජිනේරු) තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම - 2025**

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම්කරන මාධ්‍ය සහ අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල-2 / දෙමළ- 3/ ඉංග්‍රීසි-4

| | |
|---|---|
| | |

*සටහන* : අයදුම් කරනු ලබන මාධ්‍ය පසුව වෙනස් කළ නොහැක.

01. (i) සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ........................................................
(සිංහලෙන්/ දෙමළෙන්)
(ii) සම්පූර්ණ නම : …………………………………………………….
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(iii) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : ………………………..…………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
උදා : GUNAWARDHANA, M.G.B.S.K.

02. (i) ස්ථිර ලිපිනය : ……………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) දුරකථන අංකය : ස්ථාවර

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ජංගම

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

03. (i) ස්ත්‍රී / පුරුෂ භාවය : ……………………………

(ii) විවාහක / අවිවාහක බව : ……………………………

04. (i) උපන් දිනය :

වර්ෂය: …………. මාසය : ………… දිනය : ………….

(ii) 2025 ඔක්තෝබර් මස 12 දිනට වයස :

අවුරුදු : ………… මාස : ……… දින : ………

(iii) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද යන වග?
………………………………………

(iv) ජාතිය : …………………………………..

(v) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

05. (i) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති අධ්‍යාපන සුදුසුකම් :

| *විභාගය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|
| | | |
| | | |

(ii) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම් :

| *සුදුසුකම* | *වර්ෂය* | *ආයතනය* |
|---|---|---|
| | | |
| | | |

(iii) මෙම තනතුරට අයදුම්කිරීම සඳහා ලබාගෙන ඇති ක්ෂේත්‍ර පළපුරුද්ද :

| තනතුර | ආයතනය | කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |

(iv) භාෂා ප්‍රවීණතාවය :

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

06. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

(i) තනතුර : ....................................................
(ii) දෙපාර්තමේන්තුව/ ආයතනය : ......................................................
(iii) පත් වූ දිනය : ..............................................
(iv) ස්ථිර ද, විශ්‍රාම වැටුප් සහිත ද, තාවකාලික ද, නැතහොත් කොන්ත්‍රාත් පදනම මත ද යන වග : ..............................
(v) වාර්ෂික වැටුප් පරිමාණය : ............................................................
(vi) දැනට ලබන වාර්ෂික වැටුප : ...........................................

07. ඔබ ගැන තොරතුරු විමසා දැනගත හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම, ලිපිනය, තනතුර/රැකියාව සහ දුරකථන අංකය සඳහන් කරන්න.

(i) ...............................................................
...............................................................
(ii) ...............................................................
...............................................................

08. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත්, මම දැන සිටිමි.

.................................,
දිනය : ................. අයදුම්කරුගේ අත්සන.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................................ මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 2025 ........... මස ............ වැනි දින ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් ප්‍රකාශ කරමි.

............................,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය : ..........................
ස්ථානය : .......................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10. අයදුම්කරු රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නිරත නම්,ඔහු පිළිබඳව ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................ නමැති අයදුම්කරු / අයදුම්කාරිය .......................වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක බවත්, අයදුම්කරු / අයදුම්කාරිය සේවයේ ස්ථිර කර ඇති /නැති බවත්, ඉහත 05 හි සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, 2025 ............ මස ..........දින ඔහු / ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, මෙයින් සහතික කරමි.

......................................................,
දිනය:............................. රාජ්‍ය /පළාත් රාජ්‍ය ආයතන ප්‍රධානියාගේ හෝ ඔහුගේ බලයලත් නිලධාරියාගේ අත්සන.

09-112

## විගණන සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරි තනතුර සඳහා ඍජු ධාරාව මත බඳවා ගැනීම - 2024

ජාතික විගණන කාර්යාලයේ, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරි තනතුරට ඍජු ධාරාව මත බඳවා ගැනීම සඳහා අංක 2366/31 හා 2024.01.12 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 7.2.4 වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පහත සඳහන් සුදුසුකම්ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවාගැනීමේ ක්‍රමය :- ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරි තනතුරේ පවතින පුරප්පාඩු 11ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 7.2.4.1.1 උපවගන්තියේ සඳහන් වෘත්තිය සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවා විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව විගණන සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලැබේ.

   පත්වීම ක්‍රියාත්මක වන දිනය විගණන සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

2. අවශ්‍ය සුදුසුකම් :- සෑම අයදුම්කරුවකුම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය:

   I. වෘත්තීය සුදුසුකම් :-
   ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය;

   *හෝ*

   ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥවරයකු වීම.

   II. අධ්‍යාපන සුදුසුකම් :- අදාළ නොවේ.

   III. පළපුරුද්ද :- අදාළ නොවේ.

   IV. ශාරීරික යෝග්‍යතාව:-
   ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

   V. වෙනත් සුදුසුකම්:-
   (i). ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
   (ii). විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම.
   (iii). යම් ආගමික පැවිදිවරයක් දරන තැනැත්තකු නොවීම.
   (iv). අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

   VI. වයස:-
   2025 ඔක්තෝබර් මස 12 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර එදිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. ඒ අනුව 1990.10.12 දින සිට 2003.10.12 දින දක්වා එම දින ද ඇතුළත්ව උපන් දිනය යෙදෙන අයට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

   (රාජ්‍ය සේවයේ නියුක්ත නිලධරයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සටහන** :- ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා ඍජු ධාරාව මත බඳවා ගැනීමේ දී සේවා අවශ්‍යතාව සැලකිල්ලට ගෙන අවශ්‍ය අවස්ථාවල දී ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥවරුන් බඳවා ගැනීමේ බලය විගණන සේවා කොමිෂන් සභාව සතුවේ. එසේ ඍජුව බඳවාගනු ලබන තැනැත්තන් ඉහත 2.V හි සඳහන් අනෙකුත් මූලික සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා කොන්දේසි :-

(i). මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii). මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii). 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර තුනක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv). රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, විගණන සේවා කොමිෂන් සභාව විසින් ඉදිරියේදී පනවනු ලබන / පැනවිය හැකි කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v). ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

4. වැටුප් පරිමාණය :- 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය **රු.86,950 - 10 x 2,400 - 8 x 2,940 - 17 x 3,900 - රු.200,770/- (පියවර 01) වේ.**

මෙම තනතුරට හිමි වැටුප් කේතය AS 03 - 2025 වන අතර ආරම්භක වැටුප් පියවර රු.86,950/- වේ. (2027.01.01 දින තෙක් ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ උපලේඛන III අනුවය.) මෙයට අමතරව තනතුරට අදාළ වන පරිදි රජය විසින් අනුමතකර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු ලබා දීමේ පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| *අනු අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්-** | | 25 |
| | (අ) සාමාන්‍ය උපාධිය | 10 | |
| | (ආ) විශේෂ උපාධිය | 11 | |
| | (ඇ) 2 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය | 11 | |
| | (ඈ) 2 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය | 13 | |
| | (ඉ) 1 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය | 13 | |
| | (ඊ) 1 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය | 15 | |
| | (උ) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br><br>(රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 18 | |
| | (ඌ) **MA/MSC හෝ ඒ හා සමාන වෙනත් උපාධියක්** (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 20 | |
| | (එ) **ඉහත (ඌ) හි සඳහන් උපාධියකට වඩා ඉහළ උපාධියක්** (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති,ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 25 | |

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 02. | **අතිරේක වෘත්තීය සුදුසුකම් :**<br><br>(මූලික වෘත්තීය සුදුසුකමට අමතරව ලබා ඇති ඉහළම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)<br>(අ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාව<br>(ආ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික II /අන්තර්මාධ්‍ය පරීක්ෂණය /ගිණුම්කරණ හා ව්‍යාපාර සහතික පත්‍රය II / ව්‍යාපාර අදියර/ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ II අදියර පරීක්ෂණය සමත් වීම<br>(ඇ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන I කොටසේ පරීක්ෂණය / වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ III අදියර පරීක්ෂණය සමත් වීම<br>(ඈ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය<br>(ඉ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය | <br><br><br>07<br><br>09<br><br>12<br><br>15<br><br>20 | 20 |
| 03. | තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද | | 40 |
| 04. | **තොරතුරු තාක්ෂණය / පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම්**<br>විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයකින් පිරිනමනු ලබන මාස 6ක හෝ ඊට වැඩි කාලයක පරිගණක සහතිකපත්‍ර පාඨමාලාවක් සමත්ව තිබීම හා සහතිකයක් ලබා තිබීම. | 05 | 05 |
| 05. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | | 10 |
| | **මුළු එකතුව** | | **100** |

6. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ:

(i). පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii). වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :-

(i). අයදුම්පත් "ලේකම්, විගණන සේවා කොමිෂන් සභාව, අංක 35/ඒ, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, කොළඹ 08." යන ලිපිනය සඳහන් කර 2025 ඔක්තෝබර් මස 12 වැනි දිනට හෝ එදිනට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii). ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට අංක 04 දක්වාත් දෙවැනි පිටුව අංක 05 සිට අංක 08 දක්වාත් තෙවැනි පිටුව අංක 09 සිට අංක 10 දක්වාත් වන ආකාරයට පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii). අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරී තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

(iv). අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.71,240/-ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v). අයදුම්පතක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදුවිය හැකි ප්‍රතිවිපාක තමන් විසින් ම විඳ දරා ගත යුතුය.

(vi). විදේශගත ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ට තම අයදුම්පත් විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත එවනු සඳහා තමන් පදිංචි රටට *නැතහොත්* ආසන්නම රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට ස්වකීය අභිමතය පරිදි පිළිවන.

(vii). වෛද්‍ය පරීක්ෂණ සඳහා යානාපත්‍ර - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස පිටරටින් තෝරාගනු ලබන ශ්‍රී ලාංකික අයදුම්කරුවෙකු වේ නම්, ඔහු සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා වන ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ යානාපත්‍ර වියදමත් එම අයදුම්කරු විසින්ම දැරිය යුතුය.

(viii). රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් නියමිත දින හෝ එදිනට පෙර ලැබෙන සේ විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, මෙම කාර්යාලයේ කිසිදු නිලධාරියෙකු නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

(ix). මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(x). අයදුම්පත්‍රය සමඟ පහත ලේඛනවල සහතික කරන ලද එක් ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතුය:

- අ) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත,
- ආ) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත
  (**සැ.යු.** :- බෞතීස්ම සහතික හෝ උපකෘත පාසැල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත්කරන ලද උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.),
- ඇ) සාමාන්‍ය උපාධිය සහ එයට ඉහළ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පිටපත් (අංක 5 යටතේ සඳහන්),
- ඈ) ප්‍රධාන වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ 2. I පරිදි) සහ අතිරේක වෘත්තීය සුදුසුකම් (අංක 5 යටතේ සඳහන්) සනාථ කෙරෙන සහතික පිටපත්,
- ඉ) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතික,
- ඊ) තොරතුරු තාක්ෂණය හා පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් (අංක 5 යටතේ සඳහන්),
- උ) චරිතය පිළිබඳව සඳහන්වන මෑතකදී ලබාගත් සහතික දෙකක්,
  (දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට අදාළ නොවේ.).

**සටහන -** සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතික කරන ලද පිටපත් සනාථකර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

8. සාවද්‍ය තොරතුරු සැපයීම:-

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හා නොපිරවීමේ අයිතිය විගණන සේවා කොමිෂන් සභාව සතු වේ.

10. මෙම *ගැසට්* පත්‍රයේ I කොටසේ II (අ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන්කර ඇති පරිදි රාජ්‍ය සේවා පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි මෙම තනතුරට බඳවා ගැනීම සඳහා ද අදාළ වේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

විගණන සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී. කේ. විජේසිංහ,
ලේකම්,
විගණන සේවා කොමිෂන් සභාව.

2025 සැප්තැම්බර් මස 04 වැනි දින,
අංක 35/ඒ, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08,
විගණන සේවා කොමිෂන් සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ජාතික විගණන කාර්යාලය**

**ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරි තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම - 2024 වර්ෂය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල-2 / දෙමළ- 3/ ඉංග්‍රීසි-4

*සටහන.*- අයදුම් කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

---

01. (i) සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ........................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

(ii) සම්පූර්ණ නම : ………………………………………………….
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(iii) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : ……………………….…………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
උදා : GUNAWARDHANA, M.G.B.S.K.

02. (i) ස්ථිර ලිපිනය : ………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) දුරකතන අංකය : ස්ථාවර

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ජංගම

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

03. (i) ස්ත්‍රී / පුරුෂ භාවය : ……………………………
(ii) විවාහක / අවිවාහක බව : ……………………………

04. (i) උපන් දිනය :
වර්ෂය: …………. මාසය : ………… දිනය : ………….

(ii) 2025 ඔක්තෝබර් මස 12 වැනි දිනට වයස :
අවුරුදු : ………… මාස : ……… දින : ………

(iii) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

05. (i) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම් :

| *විභාගය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|
| | | |
| | | |

(ii) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති අධ්‍යාපන සුදුසුකම් :

| *සුදුසුකම* | *වර්ෂය* | *ආයතනය* |
|---|---|---|
| | | |
| | | |

(iii) මෙම තනතුරට අයදුම් කිරීම සඳහා ලබාගෙන ඇති ක්ෂේත්‍ර පළපුරුද්ද :

| *තනතුර* | *ආයතනය* | *කාල සීමාව* |
|---|---|---|
| | | |
| | | |

(iv) භාෂා ප්‍රවීණතාවය :

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

06. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

(i) තනතුර : ……………………………………………
(ii) දෙපාර්තමේන්තුව/ ආයතනය : ……………………………………………
(iii) පත් වූ දිනය : ……………………………………………
(iv) ස්ථිර ද, විශ්‍රාම වැටුප් සහිත ද, තාවකාලික ද, නැතහොත් කොන්ත්‍රාත් පදනම මත ද යන වග : ……………...............
(v) වාර්ෂික වැටුප් පරිමාණය : ……………………………………………
(vi) දැනට ලබන වාර්ෂික වැටුප : ……………………………………..

07. ඔබ ගැන තොරතුරු විමසා දැනගත හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න.-

(i) ……………………………………………………………
……………………………………………………………
(ii) ……………………………………………………………
……………………………………………………………

08. *අයදුම්කරුගේ සහතිකය :*

මෙම අයදුම්පත්‍රයෙ හි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත්, මම දැන සිටිමි.

.................................
දිනය : ……………… අයදුම්කරුගේ අත්සන.

09. ***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :***

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ......................………………………………………………………….............. .............. මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු / ඇය ....................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් ප්‍රකාශ කරමි.

…..………………….
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය : ………………………
ස්ථානය : ……………………………….
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10. අයදුම්කරු රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නිරත නම්, ඔහු පිළිබඳව ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ………………………………………………….. නමැති අයදුම්කරු / අයදුම්කාරිය ……………………වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක බවත්, අයදුම්කරු / අයදුම්කාරිය සේවයේ ස්ථිර කර ඇති /නැති බවත්, ඉහත 05 හි සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, 2025 ............... මස ….. දින ඔහු / ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, මෙයින් සහතික කරමි.

......................................................
දිනය:............................. රාජ්‍ය /පළාත් රාජ්‍ය ආයතන ප්‍රධානියාගේ හෝ ඔහුගේ
බලය ලත් නිලධාරියාගේ අත්සන.

09-113

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ /අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2025 ඔක්තෝබර් මස 13 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 අගෝස්තු මස 18 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කොළඹ | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රදේශයේ අතිරේක (සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ. |

09-104

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ /අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර්ධූරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2025 ඔක්තෝබර් මස 13 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 අගෝස්තු මස 21 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | කුලියාපිටිය බටහිර | මයුරාවතී කෝරළය කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | කුලියාපිටිය නැගෙනහිර | මැද්දෙකැටිය කෝරළය කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | පොල්ගහවෙල | උඩපොල ඕතර බටහිර කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ දඹදෙණි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

09-71

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2025.09.30** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

*සැ.යු.:-* තනතුරු කිහිපයක් සඳහා අයදුම්කරන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**1. මෝටර් කාර්මික තනතුර:- [පුරප්පාඩු සංඛ්‍යාව 01]**

1.1 **වැටුප් පරිමාණය:-**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය
**රු. 51,020 – 11 x 590 / 10 x 680 – රු. 64,310/- වේ.**
(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 89,000:- පමණ වේ).

1.2 **වයස් සීමාව :-**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

1.3 **අධ්‍යාපන සුදුසුකම් :-**

සිංහල/ දෙමළ භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථයන් ද, ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වී සිටීම.

1.4 **වෘත්තීය සුදුසුකම් :-**

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය මඟින් හෝ රජයේ/ පිළිගත් පෞද්ගලික ආයතනයක් මඟින් පවත්වනු ලබන මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ වසර 3 කට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකොට තිබීම.

*සහ*

සියළුම වර්ගවල වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් තිබීම.

(මෝටර් කාර්මික ක්ෂේත්‍රයට අදාළව NVQ Level 4 හෝ ඉහළ මට්ටමේ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැළකේ)

1.5 **පළපුරුද්ද** :-

රජයේ/පිළිගත් ආයතනයක මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ වසර පහකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

1.6 **බඳවා ගැනීමේ ක්‍රමය:-**

ලිඛිත පරීක්ෂණයක්, ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

1.7 **පරීක්ෂණ ක්‍රමවේදය**

(අ) *ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ:-*

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පත් කරනු ලබන අධීක්ෂක මණ්ඩලයක් මඟින් හෝ තෝරාගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් ලිඛිත පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා එහි දී පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

| *පරීක්ෂණය* | *පරීක්ෂා කරනු ලබන විෂයය ක්ෂේත්‍රයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | මෝටර් කාර්මික දැනුම හා නඩත්තු කටයුතු පිළිබඳ දැනුම | 100 |
| ප්‍රායෝගික පරීක්ෂණය | මෝටර් කාර්මික කටයුතු හා නඩත්තු කටයුතු පිළිබඳ ප්‍රායෝගික දැනුම හා කුසලතාව | 100 |

(ආ) *සම්මුඛ පරීක්ෂණය :-*

ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි. (100)

| *අනු අංකය* | *විෂයය ක්ෂේත්‍රය* |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන කුසලතා |

**2. සහකාර ගබඩා භාරකරු තනතුර:- [ඇබෑර්තු 01]**

2.1 **වැටුප් පරිමාණය:-**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

**රු. 51,020 – 11 x 590 / 10 x 680 – රු. 64,310/- වේ.**

(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 89,000 පමණ වේ).

2.2 **වයස් සීමාව:-**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

2.3 **අධ්‍යාපන සුදුසුකම්:-**

සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථයන් ද, ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී සිටීම.

2.4 **වෘත්තීය සුදුසුකම්:-**

සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය (ISMM) විසින් නිකුත් කළ ගබඩා තබා ගැනීම/ ගබඩා කළමනාකරණය පිළිබඳ සහතිකයක් සහ දත්ත නිවේෂණය පිළිබඳ මූලික දැනුම ලබා තිබීම.

2.5 **පළපුරුද්ද:-**

රජයේ/ පිළිගත් ආයතනයක සහකාර ගබඩා භාරකරුවකු ලෙස වසර පහකට නොඅඩු කාලයක පළපුරුද්දක් ලබා තිබීම.

2.6 **බඳවා ගැනීමේ ක්‍රමය:-**

ලිඛිත පරීක්‍ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මඟිනි.

2.7 **පරීක්ෂණ ක්‍රමවේදය:**

(අ) ***ලිඛිත පරීක්ෂණය :***

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන අධීක්ෂක මණ්ඩලයක් මඟින් හෝ තෝරාගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් ලිඛිත පරීක්ෂණයක් පවත්වා අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණ සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය 100 කි.

(ආ) ***සම්මුඛ පරීක්ෂණය :***

ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| *අනු අංකය* | *විෂයය ක්ෂේත්‍රය* |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

**3. පින්තාරුකරු තනතුර:- [පුරප්පාඩු සංඛ්‍යාව 01]**

3.1 **වැටුප් පරිමාණය :-**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු**. 47,240 – 9 x 540 / 10 x 590 / 3 x 680 – රු. 60,040/- වේ.**
(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 85,000 පමණ වේ).

3.2 **වයස් සීමාව :-**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

3.3 **අධ්‍යාපන සුදුසුකම්:-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.
(සටහන:- පින්තාරු ක්ෂේත්‍රයට අදාළව NVQ 3 සහතිකයක් හෝ ඊට ඉහළ සහතිකයක් ලබා තිබේ නම් ඉහත පරිදි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම අනිවාර්ය නොවේ.)

3.4 **වෘත්තීය සුදුසුකම්:-**

පින්තාරු/පෙදරේරු ක්ෂේත්‍රයට අදාළව NVQ 3 සහතිකයක් ලබා තිබීම.

3.5 **පළපුරුද්ද:-**

පිළිගත් ආයතනයක පින්තාරු ක්ෂේත්‍රයේ වසර 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

3.6 **බඳවා ගැනීමේ ක්‍රමය :-**

වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

3.7 **පරීක්ෂණ ක්‍රමවේදය :-**

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන අධීක්ෂක මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

(අ) *වෘත්තීය පරීක්ෂණය :*

මෙහිදී අයදුම්කරු සතු පින්තාරුකරණයේ ශිල්පීය දැනුම, ප්‍රවීණතාවය සහ අවශ්‍ය කුසලතා පරීක්ෂා කරනු ලැබේ. ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

(ආ) *සම්මුඛ පරීක්ෂණය :*

සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| *අනු අංකය* | *විෂයය ක්ෂේත්‍රය* |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන කුසලතා |

**4. නළ පවිත්‍රකරු තනතුර:- [පුරප්පාඩු සංඛ්‍යාව 01]**

4.1 **වැටුප් පරිමාණය :-**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. **47,240 – 9 x 540 / 10 X 590 / 3 x 680 – රු. 60,040/- වේ.**
(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 85,000 පමණ වේ).

4.2 **වයස් සීමාව :-**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

4.3 **අධ්‍යාපන සුදුසුකම්:-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සිංහල/ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.
**(*සටහන*:- ජලනළ කාර්මික ක්ෂේත්‍රයට අදාළව NVQ 3 සහතිකයක් හෝ ඊට ඉහළ සහතිකයක් ලබා තිබේ නම් ඉහත පරිදි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම අනිවාර්ය නොවේ.)**

4.4 **වෘත්තීය සුදුසුකම්:-**

ජලනළ කාර්මික ක්ෂේත්‍රයට අදාළව NVQ 4 සහතිකයක් ලබා තිබීම.

4.5 **පළපුරුද්ද:-**

පිළිගත් ආයතනයක ජලනළ කාර්මික ක්ෂේත්‍රයේ වසර 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

4.6 **බඳවා ගැනීමේ ක්‍රමය :-**

වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මඟිනි.

4.7 **පරීක්ෂණ ක්‍රමවේදය:-**

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන අධීක්ෂක මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

*(අ) වෘත්තීය පරීක්ෂණය:*

මෙහිදී අයදුම්කරු සතු ජලනළකරණයේ ශිල්පීය දැනුම, ප්‍රවීණතාවය සහ අවශ්‍ය කුසලතා පරීක්ෂා කරනු ලැබේ. ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියයකි. (100)

*(ආ)* සම්මුඛ පරීක්ෂණය :

සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි. (100)

| *අනු. අංකය* | *විෂයය ක්ෂේත්‍රය* |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

**5.** ගෘහපාලන සහායක තනතුර:- **[පුරප්පාඩු සංඛ්‍යාව 06]**

5.1 **රාජකාරී ස්වභාවය :-**

පාර්ලිමේන්තු සංකීර්ණයේ පිරිසිදුකම සහ සනීපාරක්ෂාව පවත්වා ගැනීම සහතික කරමින් ආහාරපාන හා සහ ගෘහපාලන සේවා, දෙපාර්තමේන්තුවට අනුයුක්තව අදාළ දෛනික පිරිසිදු කිරීම් හා ගෘහපාලන රාජකාරී ඉටු කිරීම මෙම තනතුර හරහා අපේක්ෂා කෙරේ.

5.2 **මාසික වැටුප් පරිමාණය :-**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය
**රු. 42,290 - 9 x 490/10 x 540/6 x 590 - රු.55,640/- වේ.**
(සියලුම අතිරේක දීමනා සහිතව මෙම තනතුරට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.80,000:- ක් පමණ වේ.)

5.3 **වයස් සීමාව :-**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර ඇති අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ).

5.4 **අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද :-**

*අධ්‍යාපන සුදුසුකම්* - සිංහල/දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද සහිතව අ.පො.ස. (සා. පෙළ) විභාගය විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම;

***වෘත්තීය සුදුසුකම් -*** ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) හෝ රජය විසින් පිළිගනු ලබන වෙනත් ආයතනයක, හෝටල් ගෘහ පාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ මාස පහකට නොඅඩු පාඨමාලාවක සහතිකයක් ලබා තිබීම;

*හෝ*

හෝටල් ගෘහපාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ NVQ LEVEL 2 සහතිකයක් ලබා තිබීම;

*පළපුරුද්ද:* අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව තරු පංතියේ හෝටලයක හෝටල් ගෘහ පාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු පළපුරුද්දක් තිබීම.

5.5 **බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

*(අ) ලිඛිත/වෘත්තීය පරීක්ෂණය:*

උක්ත තනතුර සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් අතුරින් සුදුසුකම්ලත් අයදුම්කරුවන් මෙම ලිඛිත/වෘත්තීය පරීක්ෂණයට මුහුණ දිය යුතුය. මෙහිදී හෝටල් ගෘහපාලනය, කාමර සේවය හෝ කාමර සහායක සේවය යන ක්ෂේත්‍රයන්ට අදාළව අයදුම්කරුවන්ගේ කුසලතා නිර්ණය කිරීම සිදු කරනු ලැබේ. මෙහිදී පැය 1 ක ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එකී පරීක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියයකි. (100)

*(ආ) සම්මුඛ පරීක්‍ෂණය :*

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මඟින් පහත සඳහන් නිර්ණායක පාදක කර ගනිමින් ව්‍යූහගත සම්මුඛ පරීක්‍ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියයකි. (100)

| *අනු.අංකය* | *විෂයය ක්ෂේත්‍රය* |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන කුසලතා |

## 6. ආරක්ෂක නිලධාරි තනතුර:- [පුරප්පාඩු සංඛ්‍යාව 01]

**6.1 වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය
**රු. 47,240 - 9 x 540/10 x 590/3 x 680 - රු. 60,040 වේ.**
(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාල අවම ආරම්භක දළ මාසික වැටුප රු.85,000.00 පමණ වේ).

**6.2 අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:-**

සිංහල හෝ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයන්ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වී තිබීම

*සහ*

වසර 10 කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත යුධ හමුදාවේ සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවක (නිත්‍ය) සාමාජිකයෙකු හෝ වසර 10 කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා පොලීසියේ සාමාජිකයෙකු වීම.

*හෝ*

අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ 'ඒ' හෝ 'බී' වැටුප් කාණ්ඩවලට අයත් තනතුරක වසර 10ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**6.3 වයස් සීමාව:**

අයදුම්පත් භාරගැනීම අවසන්වන දිනට වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**6.4 බඳවා ගැනීමේ ක්‍රමය:**

ලිඛිත පරීක්‍ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මඟිනි.

(අ) *ලිඛිත පරීක්ෂණය :*

| *පරීක්ෂණය* | *පරීක්ෂා කරනු ලබන විෂයය ක්ෂේත්‍රයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | භාෂා හැකියාව සහ සාමාන්‍ය දැනීම | 100 |

(ආ) *සම්මුඛ පරීක්ෂණ :*

ලිඛිත පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි. (100)

| | *විෂයය ක්ෂේත්‍රය* |
|---|---|
| 01 | අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 02 | විෂය දැනුම |
| 03 | පළපුරුද්ද |
| 04 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

**7. සේවා නියමයන් හා කොන්දේසි :**

(i) මෙම තනතුරු ස්ථිරය. මෙම තනතුරුවලට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබයි. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය කරනු ලැබූ අයදුම්කරුවකු හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යය මණ්ඩලයේ සේවයේ ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක (01) වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ඇත.

(ii) පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මකවන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට බලය ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයට අදාළවන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන්, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් දායකත්වය ලබා දිය යුතුය.

(iv) තෝරාගත් අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(iv) තෝරාගත් අයදුම්කරුවන් පත්කිරීමට පෙර ඔහු/ඇය පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම සිදු කරනු ඇත.

8. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

*(අ)* ජාතික හැඳුනුම්පත;
*(ආ)* උප්පැන්න සහතිකය;
*(ඇ)* අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
*(ඈ)* වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
*(ඉ)* පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

9. මෝටර් කාර්මික තනතුර සඳහා පමණක් ඉහත 8 (අ) සිට (ඉ) දක්වා සහතිකවලට අමතරව සියළුම වර්ගවල වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක පිටපතක් ද ඇමිණිය යුතුයි.

10. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය. ආරක්ෂක නිලධාරි තනතුර සඳහා අයදුම් කරන සන්නද්ධ හමුදාවල සහ පොලීසියේ සේවය කරන අයදුම්කරුවන් ද, සිය අයදුම්පත් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා එවිය යුතු ය.

11. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

12. අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ වැළදි යැයි යමෙකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

13. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙළ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කුෂානි රෝහණදීර
පාර්ලිමේන්තුවේ මහ ලේකම්

2025 සැප්තැම්බර් මස 10 වැනි දින ,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

**ආදර්ශ අයදුම්පත්‍රය**

---

.......................................................... **තනතුර**

1. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..................................................................
   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) : ..................................................................
   (ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (මහතා/මහත්මිය/මෙනවිය) ..................................................................
   ..................................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3. (අ) (i) පෞද්ගලික ලිපිනය : ..................................................................
   ..................................................................................................................................................
   ..................................................................................................................................................
   (ii) විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail) : ..................................................................
   (iii) දුරකථන අංකය : | | | | | | | | | | |
   (iv) WHATSAPP දුරකථන අංකය : | | | | | | | | | | |

   (ආ) (i) කාර්යාලයීය ලිපිනය : ..................................................................
   ..................................................................................................................................................
   ..................................................................................................................................................
   (ii) දුරකථන අංකය | | | | | | | | | | |

   (ඇ) විභාග ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ලිපිනය සඳහන් කරන්න.
   පෞද්ගලික ☐
   රාජකාරී ☐

4. (අ) උපන් දිනය : වර්ෂය .............. මාසය .............. දිනය ..............
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතු ය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු .............. මාස .............. දින ..............

5. විවාහක/අවිවාහක බව : ..........................................................................

6. ස්ත්‍රී /පුරුෂ භාවය : ..........................................................................

7. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/ නැත)

8. අධ්‍යාපන සුදුසුකම් : (සහතික පිටපත් අමුණා තිබිය යුතු ය)

| *විභාගය* | *විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|
| අ.පො.ස. (උ/පෙළ) | | | |
| | | | |
| | | | |
| | | | |
| අ.පො.ස. (සා/පෙළ) | සිංහල / දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් : (සහතික පිටපත් අමුණා තිබිය යුතු ය)

| *පාඨමාලාව* | *ආයතනය* | *ක්‍රියාත්මකවන දිනය (Effective date)* |
|---|---|---|
| | | |
| | | |
| | | |

10. වෙනත් සුදුසුකම් : (සහතික පිටපත් අමුණා තිබිය යුතු ය)
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

11. පළපුරුද්ද : (සහතික පිටපත් අමුණා තිබිය යුතු ය)

| *ආයතනය* | *තනතුර* | *සේවා කාලසීමාව* |
|---|---|---|
| | | |
| | | |
| | | |

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර : (අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය)

(අ) ආයතනයේ නම : ...........................................................................
(ආ) ආයතනයේ ලිපිනය : ...........................................................................
(ඇ) මුල් පත්වීමේ දිනය : ...........................................................................
(ඈ) දැනට දරන තනතුර : ...........................................................................
(ඉ) මාසික මූලික වැටුප : ...........................................................................
(ඊ) දීමනා : ...........................................................................
(උ) දළ වැටුප : ...........................................................................

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/ නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න : ...........................................................................
...........................................................................
...........................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? (ඔව්/ නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න : ...........................................................................
...........................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

දිනය : ......................... ...........................................................
අයදුම්කරුගේ අත්සන.

---

**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

**රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ...................................... තනතුර දරන ........................................................ මයා/මිය/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න)

දිනය : ..................................... ………...............................................
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

09-169

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.